ද. 30.01.2008

# "ටිගෝ" ග්‍රාහකයන්ට සුසුකි මෝටර් රථයක්

ටිගෝ පළමු සංවත්සරය සැමරීම උදෙසා "SMS and WIN" වැඩසටහන පසුගියදා දියත් කළේය. මෙම SMS තරග වෙනත් ආකාරයකට හැරවීමක් ලෙස සැලකිය හැක.

මෙම තරගාවලියට සහභාගිවෙන ටිගෝ ග්‍රාහකයන්ට මිලියන 2 ක් වටිනා සුසුකි සෙන් මෝටර් රථයක් ජයග්‍රහණය කිරීමේ අවස්ථාව ලැබේ. ඊට අමතරව සති දෙකකට වරක් සුසුකි EN 125 මෝටර් සයිකල් දිනා ගැනීමේ අවස්ථාවද උදා වේ.

ටිගෝ ග්‍රාහකයින් මේ සඳහා කළ යුත්තේ "Tigo" යන වචනය අංක 7272 ට SMS කිරීම පමණි. එක පණිවිඩයක් එවීමෙන් පමණක් ග්‍රාහකයකුට අවසාන මහා තරගයට ඇතුළත් විය හැකියි. එහෙත් වැඩි SMS සංඛ්‍යාවක් එවීමෙන් ජයග්‍රහණය කිරීමේ අවස්ථාව වැඩිවේ. මෙසේ සඳහන් කළේ ටිගෝ ප්‍රධාන විධායක නිලධාරී දුමින්ද රත්නායක මහතාය.

මෙවැනි තරගයක් ශ්‍රී ලංකාවේ දියත් කළ ප්‍රථම අවස්ථාව මෙය වේ. නවතම ත්‍යාගය පිළිබඳව අදහස් දැක්වූ රත්නායක මහතා කියා සිටියේ වටිනාකමට අතිරේකව ලබාදෙන සේවා හඳුන්වාදීමේදී එය නවතම ආකාරයකට ඉදිරිපත් කිරීමට ටිගෝ උත්සාහ කරන බවයි. ටිගෝ පාරිභෝගිකයාට විනෝදයක් SMS වැනි සේවාවක් විදහා දැක්වීමත් ටිගෝ ඉලක්කය බවය.